# සිංහල ප්‍රාකෘතයේ ක්‍රියා යෝජන විධි


ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා වරකාවේ ධම්මාලෝක හිමියන් විසින් ඉදිරිපත් කරන ලද නිබන්ධනයකි.



PERA



වරකාවේ ධම්මාලෝක හිමි.



ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය

පේරාදෙණි මණ්ඩපය

1973



347405

# සම්පිණ්ඩනය

"සිංහල ප්‍රාකෘතයෙහි ක්‍රියා යෝජන විධි" නමැති මෙම නිබන්ධනය පරිච්ඡේද පහකින් සමන්විත වෙයි. ඒ එක් එක් පරිච්ඡේදයෙහි පහත දැක්වෙන කරුණු ඇතුළත් වෙයි.

## 1 පරිච්ඡේදය

### සිංහල ප්‍රාකෘතයේ වර්ණ මාලාව

සංයෝජනය හා සංකේතික ලක්ෂණයන්ට අනුව සිංහල ප්‍රාකෘත යුගයට අයත් භාෂාවෙහි අක්ෂර මාලාව විග්‍රහයට භාජන කිරීම මෙම පරිච්ඡේදයෙහි අරමුණ විය. එහිදී අක්ෂර මාලාව සමස්තයක් වශයෙන් ගෙන විග්‍රහාත්මක විවරණයක් කිරීම මිස එහි ඓතිහාසික කරුණු සාකච්ඡා කිරීමට අදහස් නොකරන ලදී.

## 2 පරිච්ඡේදය

### සිංහල ප්‍රාකෘතයෙහි මූලික වාක්‍යාකෘති හා එහි ක්‍රියා යෝජන විධි

සිංහල ප්‍රාකෘතයෙහි ඇත්තේ ඉතා සරල අසංකීර්ණ වාක්‍ය සමුදායකි. ඒවායින් කොටසක් ක්‍රියා වියුක්ත වාක්‍ය වන අතර කොටසක් ක්‍රියා යුක්ත වාක්‍ය වේ. මෙම ලක්ෂණය පදනම කොට ගෙන ඉහත කී වාක්‍ය සමූහය විග්‍රහ කිරීමට මෙම පරිච්ඡේදයෙහි දී උත්සාහ කරන ලදී. එහිදී සිංහල ප්‍රාකෘතයේ මූලික වාක්‍යාකෘති විග්‍රහ කිරීමටත්, ඒ සමගම එම වාක්‍යයන්හි ක්‍රියා වචනයන්ගේ යෝජනය පැහැදිලි කිරීමටත් තැත් කරන ලදී.

## 3 පරිච්ඡේදය

### සිංහල ප්‍රාකෘතයෙහි ක්‍රියා

පූ.ශු. ආයස් හා ම.ශු. ආයස් යුගයන්ට අයත් භාෂා හා සසඳන කල්හි සිංහල ප්‍රාකෘතයෙහි ක්‍රියා පද්ධතිය ඉතා ලුහුඬු වුවත් මෙන්ම අසංකීර්ණ වුවකි. සිංහල ප්‍රාකෘත යුගයට අයත් භාෂාවෙන් ලැබිය හැකි,

පද, කාල, අර්ථ හෙවත් ක්‍රියා විධි, පුරුෂ හා වචන යන ලක්ෂණ දරන ක්‍රියා වචන ඇත්තේ ඉතා ස්වල්පයකි. ඇතැම් කාල, පුරුෂ හා අර්ථ සඳහා එකද උදාහරණයක් මේ කාලයට අයත් භාෂාවෙන් ලැබිය නොහැකිය. එහෙයින් සිංහල ප්‍රාකෘතයෙහි දක්නට ලැබෙන ක්‍රියා පද්ධතියේ ස්වරූපය විග්‍රහාත්මක ආකාරයකින් පරීක්ෂා කිරීමටත්, එකල ක්‍රියා පද්ධතියෙහි දක්නට නොලැබෙන එහෙත් මධ්‍ය කාලීන සිංහලයේ ක්‍රියා පද්ධතියත්, පූ.ඉ. ආර්ය හා ම.ඉ. ආර්ය යුගයන්ට අයත් ක්‍රියා පද්ධතියත් එකිනෙක හා සසඳන කල්හි සිංහල ප්‍රාකෘතයෙහි බලාපොරොත්තු විය හැකි නොයෙක් කාල, පුරුෂ හා අර්ථයන්ට අයත් විවිධ ක්‍රියා වචන, තත්කාලීන භාෂා ලක්ෂණයන්ට අනුව කල්පිත ක්‍රියා වචනයන්ගේ මාර්ගයෙන් ප්‍රතිසංස්කරණය කිරීමටත් මෙම පරිච්ඡේදයේ දී උත්සාහ කරන ලදී.

## <u>4 පරිච්ඡේදය</u>

### <u>සිංහල ප්‍රාකෘතයෙහි සන්ධි ලක්ෂණ හා පදක ශබ්දීම වෙනස්වීම්</u>

සිංහල ප්‍රාකෘතයෙහි සන්ධි ලක්ෂණ හා පදක ශබ්දීම වෙනස්වීම් ඇත්තේ ඉතා ස්වල්පයකි. සන්ධි වූහයි සිතිය හැකි වචන කීපයක් අතරින්-පතර හමුවෙයි. ඒවා වුවද සිංහල ප්‍රාකෘත යුගයේ දී සන්ධි වූ ඒවා නොව එම වචනයන්ට මූලික වූ පූ.ඉ. ආර්ය හෝ ම.ඉ. ආර්ය වචන-යන්ගෙන් බිඳගත් ඒවා වේ. නැතහොත් එම වචන සිංහල ප්‍රාකෘත ලක්ෂණ සහිතව භාෂාවට එක් වූ ඒවා වේ.

තත් කාලීන භාෂාවෙහි පදක ශබ්දීම වෙනස්වීම් පැහැදිලි නැත. එබඳු ලක්ෂණ ඇත්තේ ඉතා ස්වල්පයකි. මෙසේ දක්නට ලැබෙන සන්ධි ලක්ෂණ හා පදක ශබ්දීම වෙනස්වීම් පරීක්ෂා කිරීම මෙම පරිච්ඡේදයෙහි කරන ලදී.

සාර

## 5 පරිච්ඡේදය

## සිංහල ප්‍රාකෘතයෙහි ක්‍රියා පද්ධතිය

සිංහල ප්‍රාකෘත ක්‍රියා පද්ධතියේ ඓතිහාසික පරිණාමය පරීක්ෂා කොට එහි ස්වරූපය හා අඩුපාඩු මොනවාදැ යි පරීක්ෂා කිරීමත්, පූ.ඉ. ආයසී හා ම.ඉ. ආයසී ක්‍රියාපද්ධතිය හා සසඳන කල්හි සිංහල ප්‍රාකෘතයෙහි බලාපොරොත්තු විය හැකි සම්පූර්ණ ක්‍රියා පද්ධතිය තත්කාලීන සිංහලයෙහි ඓතිහාසික පරිණාමය හා භාෂා ලක්ෂණයන්ට අනුකූලවන ආකාරයෙන් කල්පිත ක්‍රියා වචනයන්ගේ ආකාරයෙන් ප්‍රතිසංස්කරණය කිරීමත් මෙම පරිච්ඡේදයෙහි අරමුණ විය. එසේ ප්‍රතිසංස්කරණය කරන ලද ක්‍රියා වචනයන්ගේ වරනැගීම් විධිය ද ඊ සමඟම දක්වන ලදි.

/%%%%%%%%/

පුස්තකාලය
1962 ජන 22